## 2019 ඔක්තෝබර් මස 21 වන දින සිට 27 වන දින දක්වා ප්‍රශංසා එකතු සුපුවත

### "මනස්ස්ථාපනය වූ පුද්ගලයෙක් "

01. ආරම්භක ප්‍රශංසාව:
    පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :
    **"ඔබ සොයා එන්නෝ ප්‍රීති ප්‍රමෝද වී සතුටු වෙත්වා !**
    **ඔබේ විමුක්තියට ප්‍රේම කරන්නෝ 'හිමි තුමෝ ශ්‍රේෂ්ඨ ය'යි**
    **නිරතුරු කියත්වා !"** (ගීතාවලිය 40:16)

    දෙවිඳුන් සොයා යන්නන් අත්දකින ප්‍රීතිය, නිදහස මෙතෙකැයි කිව නොහැකි තරම් ම අති ප්‍රබල වූවකි. මිනිස් ප්‍රේමය මත ගොඩනැගෙන ජීවිත හැම විටම සීමා සහිත බවකින් යුතු වුවද දෙවිඳු ප්‍රේමය කෙරෙහි යැපෙන මිනිසා අසීමිත ප්‍රේමයක පංගුකාරයකු වේ. නිතැතින්ම පාපයට ඇදී යන, පාපයට ඇදවැටෙන මිනිසා කෙරෙහි දෙවිඳුන්ගේ මහත් වූ කරුණාව ඔහුව සුව කරන, නිදහස් කරන ප්‍රේමයක් බව අත්දකින්නට දෙවිඳුන් සොයා එන්නන් හට හැකිවේ. ගැඹුරු මනස්ස්ථාපනීය කාලයකට ඇතුළු වූ ඔබ/මම දෙවිඳුන් සොයා යෑමේ ප්‍රීතිය අත්දකින්නන් වුවෙමු. ඒ අත්දැකීම මතම දෙවිඳුන්ගේ ශ්‍රේෂ්ඨත්වයට තුති පැසසුම් ගයන්නට අද අපි අවදි වෙමු.
    පුබුදු ගී අංක 134 "පරම අපරිමිත...."

03. දවසේ සුපුවත : මනස්ස්ථාපනය වූ පුද්ගලයෙක්

    i අපගේ පෞද්ගලික පාපය අපව දෙවියන් වහන්සේගෙන් ඈත් කරයි. දේව ප්‍රේමයේ ජීවිතය තුවාල කරයි. පෞද්ගලික පාපය පිළිබඳව, එහි විපාකය මගේ පවුලට, සංඝයට, දේශයට බලපාන ආකාරය පිළිබඳව අවදි විය යුතුයි. දෙවිඳුන්ට ප්‍රසන්න වීමට නම් මගේ පාපය පිළිබඳව සැබෑ මනස්ස්ථාපනයකට ඇතුල් වී දෙවිඳුන් තුළ යැපිය යුතුය. පාපයේ පතුලටම යට වී සිටියද එවිට දේව වරප්‍රසාදය හා දේව කරුණාව කරණකොට ගෙන දේව ප්‍රේමයට සාක්ෂි දරණ ජීවිත පෙරළියකට අවස්ථාව උදාවේ. එවැනි මනස්ස්ථාපනය වූ ජීවිතයක බලය, ප්‍රීතිය එම පුද්ගලයා ජීවත්වන සමාජයට, දේශයට දෙවියන් වහන්සේ ආශිර්වාදයක් වීමට සලස්වති.
    උදා: දාවිත් රජතුමා, අගුස්තීනු මුනිතුමා

    ii මනස්ස්ථාපනයේ තව තලයකි, මනස්ස්ථාපනය වූ පුද්ගලයා තුළ ඇති වන සමූලික පරිණාමනය. එම පෙරළිය බාහිරව ප්‍රකාශ වන්නේ එම පුද්ගලයාගේ චරිතයෙන්, ඇවතුම්/ පැවතුම් වලින් දේව රාජ්‍යයේ ලක්ෂණ විද්‍යාමාන වීමෙන්ය.
    මනස්ස්ථාපනය දේව පුත්‍රභාවයට ඇතුලු වීමට අවශ්‍ය කරන අඩුවීමක්ය, අත්හැරීමක්ය, හිස්වීමක්ය.
    උදා: ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා , තෙරේසා මව්තුමිය, ස්වාමි තාත්තා

04. කණ්ඩායම් සාකච්චාව සඳහා :
    * i පෞද්ගලික මනස්ස්ථාපනයට ඇතුලු වීමේදී ඔබට ඉහත ලක්ෂණ දෙක බලපෑ ආකාරය බෙදා ගන්න.
      ii ඔබගේ පාපයේ බරපතලකම සහ එහි විපාකයට අවදිවීමට ඔබට හැකි වූවා ද?

    * i සැබෑ ලෙස මනස්ස්ථාපනය වූ ජීවිතයක බලය හා ප්‍රීතිය දේශයට, ජනතාවට ආශිර්වාදයක් වීම පිළිබඳ බෙදා ගන්න.
      ii මනස්ස්ථාපනය වූ ජීවිතයක් තුළ තිබිය යුතු දේව රාජ්‍යයේ ලක්ෂණ තම ජීවිතය තුළින් විද්‍යාමාන වීම තමා අඩුවීමකි. හිස්වීමකි. අත්හැරීමකි. ඒ පිළිබඳ ඔබේ අත්දැකීම් බෙදා ගන්න.

05. අවසාන ප්‍රශංසාව :
    පුබුදු ගී අංක 227 "හැරෙනා පිණිස හරවන්න මා...."

=======================

**2019 ඔක්තෝබර් මස 28 වන දින සිට නොවැම්බර් මස 02 වන දින දක්වා**
**ප්‍රශංසා එකතු සුපුවත**

**මනස්ස්ථාපනය වූ පවුලක්**

01. ආරම්භක ප්‍රශංසාව :
    පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි....."

02. ප්‍රශංසාවට හැඳින්වීම : 1යොහාන් 4:7-10
    **"ප්‍රේමවන්තයිනි, අප එකිනෙකාට ප්‍රේම කරමු. මන්ද ප්‍රේමය දෙවියන් වහන්සේගෙන්ය. ප්‍රේම කරන සෑම දෙන ම දෙවියන් වහන්සේගෙන් උපත ලබා සිටින බැවින් උන්වහන්සේ අඳුනති. ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නාඳුනයි. මන්ද දෙවියන් වහන්සේ ප්‍රේමය ය....."**

    දෙවියන් වහන්සේගේ ප්‍රේමය කොන්දේසි රහිත අසීමිතව සමාව දෙන, දයානුකම්පාව පාන කිසිවකුට සම නොකළ හැකි උත්තරීතර ප්‍රේමයක් බව අපි අත්දකින්නෙමු. අපේ දුබලකම් ගැන ඉවසන, හැරෙන්නට, මනස්ස්ථාපනය වෙන්නට අප කැඳවන ඔවුන් වහන්සේ සිය පුත්‍රයාණන්, අපේ පාපයෙන් මිදීමේ මිලය වශයෙන් එවන්නට තරම්ම අපට ප්‍රේම කරන සේක. අප මොනතරම් වාසනාවන්ත ද? මෙතරම්ම අපට ප්‍රේම කරන තැනැන්වහන්සේට අප ප්‍රේම කළයුතු නොවේ ද? ප්‍රශංසා කළයුතු නොවේ ද? ප්‍රේමයෙහි ජීවත් වන්නන් තුළ ඔවුන් වහන්සේ නිරතුරු වැඩ සිටින සේක.
    පුබුදු ගී අංක 129 "පූර්ණයාණෙනි...."

03. දවසේ සුපුවත - මනස්ස්ථාපනය වූ පවුලක්
    පවුලක් බඳිනු ලබන්නේ එකිනෙකා තුළින් ප්‍රකාශ වන ආදරය මගිනි. කිතුනු පවුලක එම ආදරයේ පදනම ශුද්ධවූ ත්‍රිත්වයේ සම්බන්ධකමයි. ශුද්ධවූ ත්‍රිත්වයේ ජීවිතය අප වෙත ගලා ගෙන එන්නේ අප පවුලේ සමිඳාණන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වන විටයි. එවිට පවුලේ එක එක සාමාජිකයාව මෙහෙයවනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ විසිනි. එවිට පවුල තුළ එකිනෙකා ක්‍රියා කරන්නේ, ප්‍රතිචාර දක්වන්නේ ඇතුලාන්ත තුවාල, මුල්අගුණ පව්, අතීත මතකයන්, සිද්ධීන් මත නොවේ.
    මිනිස් ප්‍රේමයේ ගැඹුරු බව හමුවන්නේ මිතුරන් තුළින්වත්, දාරක ප්‍රේමයවත්, යම් කාරණයක් පිළිබඳ ඇතිවන කැපවීම තුළවත් නොව, විවාහක ප්‍රේමය තුළ ය. එම ප්‍රේමයට අපක්ෂපාතී නොවන්නට, එම ප්‍රේමයට පටහැනිව සිදුවන දේවල් වලට පවුල තුළ අවදිව සිටින්නට අවදිවිය යුතුයි.
    අප පවුල් සුවපත් වුවහොත් සභාවට, ලෝකයට සිදුකළ හැකි බලපෑම සුවිශාල ය.

04. සාකච්ඡාව සඳහා :
    i පවුලේ එකමුතුකම රැක ගැනීමට, පවුලේ එකිනෙකා තුළ මොන වගේ දුර්වලකම් තිබුණත් ඔබ එකිනෙකාට පක්ෂපාතීව ආදරය කරනවා ද?
    ii ශුද්ධවූ ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ඉදිරිපත් කරන, පවුලේ පවුල්කම රැක ගැනීමට පවුල තුළ පිළිපැදිය යුතු ක්‍රියාපටිපාටිය ඔබට මතකද? එහිදී භාවිතා කළයුතු වචන 3කි.
        1. මට අවසර ද?
        2. ඔබට ස්තුතියි.
        3. මට සමාවන්න.
        (09වන දවස බලන්න)
    ඒ ගැන බෙදා ගන්න.

    iii විවිධ මතවාද, තාක්ෂණික මෙවලම්, අධිවේගී ජීවන රටාව පවුලේ එකමුතුකමට, බැඳීම්වලට බාධාවන අකාරය ගැන අවදිවීම පිළිබඳ කථා කරන්න.

05. අවසාන ප්‍රශංසාව :
    පුබුදු ගී අංක 207 "යමු අපි එගොඩට...."

*************************

ඉ:සේ:/ඉ: